# මාර්ග සංවර්ධන අධිකාරිය
# வீதி அபிவிருத்தி அதிகாரசபை
# Road Development Authority

**"මගනැගුම මහ මැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**

"மகநெகும மஹமெதுர" டென்சில் கொப்பேகடுவ மாவத்தை, கொஸ்வத்தை, பத்தரமுல்லை, இலங்கை.

"Maganeguma Mahamedura", Denzil Kobbedaduwa Mawatha, Koswatta, Battaramulla, Sri Lanka.


මගේ අංකය / எனது இல. / My No. : RDA/CH/077

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2024.07.26

ජනාධිපති ලේකම්
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ.

හිතවත් ලේකම්තුමනි,

**<u>සේවය අවසන් කිරීම</u>**

මාර්ග සංවර්ධන අධිකාරියේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්තුමාගේ අත්තනෝමතික මැදිහත්වීම හා අනිසි බලපෑම් පසුගිය කාල සීමාවන් තුලදී නිරන්තරයෙන් සිදුවූ අතර වර්ථමානයේදී ආයතනයේ ඉහළ කලමණාකාරීත්වය වෙත ඍජු බලපෑම් එල්ල කර මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන සහ මෙහෙයුම් කටයුතුවලට අතපෙවීම් සිදු කරනු ලබයි.

මේ සම්බන්ධව පසුගිය අවස්ථාවක ඔබතුමා වෙතද මා ලිඛිතව දැනුවත් කිරීමක් සිදුකල අතර ඔබතුමාගේ මැදිහත් වීම මත එය නිවැරදි කරගැනීමට අවස්ථාව ලැබිණ.

මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ලෙස මාහට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමත කළ නොහැකි විවිධ යෝජනා සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ මතය මහාමාර්ග අමාත්‍යාංශය වෙත යොමු කළවිට, මා සමග රාජකාරි කටයුතු කිරීම අපහසු බව පවසමින් ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා මාකෙරෙහි බිද වීමට උත්සාහ දරනු ලබන බවට මාහට දැනගන්නට ලැබිණ.

පසුගිය වසර 41/2ක මාගේ සේවා කාලය තුලදී මාර්ග සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට කැළලක් ඇතිනොවන අයුරින් හා සේවකයින්ගේ අභිවෘධිය උදෙසා රටේ පවත්නා නිති රීති රෙගුලාසි වලට අනුකූලව විනිවිදභාවයකින් සහ අධ්‍යක්ෂ මන්ඩලයේ අනුමැතීන්ට යටත්ව රාජකාරි සිදු කල බව දන්වා සිටිමි.

එසේහෙයින්, තවදුරටත් මෙවැනි අත්තනෝමතික ක්‍රියා සිදු කරනු ලබන නිළධාරියෙක් යටතේ සේවය කිරීමට ඇති අකමැත්ත මත මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ධූරයේ සේවය අවසන් කිරීමට මා අද දින තීරණය කර ඇති බවත් මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි,
මෙයට විශ්වාසී,

**සි. පි. අතුළුවගේ**
**සභාපති**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

පිටපත් : ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා - කාරුණික දැන ගැනීම සඳහා
විගණකාධිපති, ජාතික විගනණ කාර්යාලය - කාරුණික දැන ගැනීම සඳහා


Telephones:-
Chairman 2862767, Director General 2862795, Working Director 2887257, General Number ++94-11-2046200
Additional Director Generals {Projects 2862485, AO&M 2864804, CD 2882194, NP 2886923}
Directorates {Administration 2865245, Construction 2864388, Engineering Services 2864803, EO&M 038-2291373, ESD 2187165
Finance 2864799, Highway Designs 2874024, Internal Audit 2872661, Lands 2889350 Legal 2186044, Mechanical 2872273
MM 2882196, Planning 2882995, Procurement 2886863, QA&PM 2887235, R&D 2632649 Rural Bridges 2623896, Training 2869342}